සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2019 ජූලි

## (AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය

(Processes, Controls and Audit)

2019-07-20
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## <u>A කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**ඩිල්ශාන්,** විදුලි උපකරණ අයිතම ආනයනය කර සිල්ලර වෙළඳාමෙහි යෙදී සිටින සමාගමක ගණකාධිකාරීවරයාය. ව්‍යාපාරය කෙරෙහි බලපාන ආර්ථික සහ නෛතික සාධක පිළිබඳව සාකච්ඡා කරන ලෙස කළමනාකරණ රැස්වීමකදී ඔහුගෙන් ඉල්ලා සිටින ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**ඩිල්ශාන්** විසින් සාකච්ඡාවට භාජනය කරනු ලැබිය හැකි ආර්ථික සාධක තුනක්(03) සහ නෛතික සාධක දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

## 02 වන ප්‍රශ්නය

**සීමාසහිත ලෝටස් සමාගමේ** මැතකදී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රුස්වීමකදී පහත සඳහන් කරුණු සාකච්ඡා කරන ලදී:

(1) දුර්වල කාර්යසාධනය නිසා ව්‍යාපාර ඒකකයක නිෂ්පාදන ක්‍රියා පටිපාටිය වසා දැමීම.

(2) නව වෙළෙඳපොලක මෙහෙයුම් සඳහා තවත් පාර්ශවයක් සමග බද්ධ මෙහෙයුම් වැඩ පිළිවෙලකට ඇතුලත් වීම.

(3) කලින් කලට ස්ථාවර වත්කම් සත්‍යාපනය සිදුකිරීම.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අවදානම් තුනී කිරීම සඳහා (to mitigate risk) අවදානම බාරගැනීම (acceptance), පිළිගතහැකි ක්‍රමයක් ලෙස සළකනු ලබන අවස්ථාවක් **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) ඉහත (1) සිට (3) දක්වා වූ එක් එක් අවදානම සඳහා භාවිත කෙරෙන අවදානම් තුනී කිරීමේ ක්‍රමය **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

අස්තිත්වයේ අභ්‍යන්තර පාලනයද ඇතුළුව, අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳව අවබෝධය ලබාගැනීම තුලින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් පැවතිමේ අවදානම විගණක විසින් හඳුනාගෙන තක්සේරු කළයුතු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණක විසින් අවබෝධයක් ලබාගත යුතු අස්තිත්වය සහ එහි පරිසරයේ ක්ෂේත්‍ර තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) අස්තිත්වයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සංරචක (components) දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**NZ ඇසෝසියේට්ස් (NZ)** යනු සහතිකවීමේ සේවා සපයනු ලබන ආයතන ජාලයකට අනුබද්ධ වරලත් ගණකාධිකාරී ආයතනයකි. NZ ආයතනයට අදාල අනෙකුත් තොරතුරු පහතින් දී ඇත:

- **රවිනාත්,** NZ හි කළමනාකාර හවුල්කරු වේ.
- කළමනාකරුවෙකු, ජ්‍යෙෂ්ඨ සහකාරවරුන් දෙදෙනෙකු (02) හා සහකාරවරුන් පස්දෙනෙකු (05) NZ ආයතනයේ වැඩ කරති.
- දැනට, කළමනාකරු විදේශ කාර්යාලයක සේවයට අනුයුක්ත කර ඇති අතර, ඊළඟ මාස 6 තුළ ඔහු කාර්යාලයේ නොසිටිනු ඇත.
- දැනට එක් (01) ජ්‍යෙෂ්ඨ සහකාරවරයෙකුද, සහකාරවරු තිදෙනෙකුද (03) මාසයක අධ්‍යයන නිවාඩු ලබා ඇත.
- සතියකින් පමණ වාර්තාකිරීමේ අවසන් දින (reporting deadline) ලෙස එකඟ වූ මහා පරිමාණ විගණන දෙකකට **රවිනාත්** සෘජුවම සම්බන්ධ වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) NZ හි හොඳින් කළමනාකරණය නොකෙරෙන තත්ත්ව පාලන පද්ධතියේ මූලිකාංග (elements) තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) NZ තුළ තත්ත්ව පාලනය පවත්වාගෙන යාම පිළිබඳව **රවිනාත්ගේ** වගකීම **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# B කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත සන්ජීවි (පෞද්ගලික) සමාගම** ආයෝජන මණ්ඩලයේ (BOI) ලියාපදිංචි සමාගමක් වන අතර, වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක් වන **කමල් ඇසෝසියේට්ස්** ආයතනයේ විගණන සේවාදායකයෙකු ද වෙයි. ඔබ, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත සන්ජීවි (පෞද්ගලික) සමාගමේ** දැනට සිදුකෙරෙමින් පවතින ව්‍යවස්ථාපිත විගණනයේ ජ්‍යෙෂ්ඨ විගණකයෙකු වෙයි. ආයෝජන මණ්ඩල ගිවිසුමේ ප්‍රතිපාදන මත පදනම්ව, මූල්‍ය වර්ෂය සඳහා අපනයනවලින් ලද ආයහාරය එහි විගණක ලවා සහතික කරවා ගැනීම සමාගම විසින් සිදුකිරීම අවශ්‍ය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඔබ විසින් සළකා බැලිය යුතුව ඇති තුන් පාර්ශව සම්බන්ධතාවය (three party relationship) සහ විෂය කරුණ (subject matter) ඉහත සඳහන් කාර්යභාරයට අදාලව **සම්බන්ධ කරන්න**. (ලකුණු 06)

(b) ඉහත විස්තර කර ඇති සහතික කිරීමේ කාර්යභාරය බාරගැනීමේදී සහ කළමනාකරණය කිරීමේදී **කමල් ඇසෝසියේට්ස්** විසින් ඉටු කළ යුතු අවශ්‍යතාවන් හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත පාක් ට්‍රේඩිං පොදු සමාගම** දේශීය වෙළෙඳපොළට ගෘහ උපකරණ අයිතම අලෙවි කිරීමේ නිරතව සිටියි. 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමේ ව්‍යවස්ථාපිත විගණක වන්නේ වරලත් ගණකාධිකාරි ආයතනයක් වන **එල්. එම්. ප්‍රනාන්දු සහ සමාගමයි**. 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ විගණන කටයුතු සැලසුම් කිරීම විගණක විසින් දැන් ආරම්භ කර තිබුණි. ඒවා නම්:

- ඉන්වොයිසිය නිකුත් කරන මොහොතේදී සමාගම විසින් ආයහාරය (revenue) හඳුනාගනු ලබන අතර, ඉන්වොයිසිය නිකුත් කිරීමෙන් පසු ඊළඟ දිනයේදී භාණ්ඩ බාරගැනීම සිදුවේ.
- ආයහාරයේ "සිදුවීම" (occurrence), අවධානය යොමුකළ යුතු ප්‍රධාන ක්ෂේත්‍රවලින් එකක් බව විගණන හවුල්කරු විස්තර කළේය.
- සමාගමේ ආයහාරය පරීක්ෂා කිරීම සඳහා බද්ධ ප්‍රවේශය (combined approach) අනුගමනය කරන ලෙස විගණන හවුල්කරු ඉල්ලා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "බද්ධ ප්‍රවේශය" යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(b) සමාගමේ ආයහාරය සිදුවීම පරීක්ෂා කිරීමට විගණක විසින් ඉටුකළ හැකි තහවුරු කිරීමේ විගණන පටිපාටි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(B) කාලානුරූපීව (timely basis) ප්‍රමාණවත් සහ යෝග්‍ය ලෙස විගණන ලේඛනගතකරණය (audit documentation) විගණනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට උපකාරී වේ. විගණක ඒ සඳහා වැඩ පත්‍රිකා භාවිත කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "විගණන ලේඛනගතකරණය" යන්න **නිර්වචනය කරන්න**. (ලකුණු 02)

(b) වැඩ පත්‍රිකාවක ඇතුලත් මූලික තොරතුරු තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත IT සොලූෂන්ස් (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයේ විගණන කළමනාකරු ඔබය. සමාගම, තොරතුරු තාක්ෂණ (IT) සම්බන්ධිත උපකරණ ආනයනය කර විකිණීමේ යෙදී සිටී.

වැඩ පත්‍රිකා පිළිබඳ ඔබගේ සමාලෝචනයේදී පහත සඳහන් කරුණු හෙළිදරව් විය:

- ඇගයීම් වාර්තාව අනුව අවසාන තොගයේ අගය රු.12,677,850/- ක් විය.
- පෙබරවාරි සහ මාර්තු මාසවලදී සමහර අයිතමයන් පිරිවැයට වඩා අඩු මිලකට විකුණා තිබුණි. මෙය තොග ඇගයීම් වාර්තාවේද සඳහන් කර තිබුණේය.
- පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට තොග අගය කරනු ලැබුවේ නම්, තොගයේ වටිනාකම රු.4,655,000/- කින් අඩුවිය යුතු වේ.
- කෙසේවෙතත්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොගයේ වටිනාකම ගැලපීමට කළමනාකරණය එකඟ වී නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණක විසින් විකරණය නොකළ විගණන මතයක් ප්‍රකාශ කළ යුත්තේ කුමන අවස්ථාවන්හිදීදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) විකරණය කළ මත (modified opinions) වර්ග දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(c) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන මත විගණන මතය කෙරෙහි ඉහතින් දක්වා ඇති කරුණුවල (issues) බලපෑම (impact) **තක්සේරු කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත සරත් එන්ජිනියරිං (පෞද්ගලික) සමාගම** ජපන් වායු සමීකරණ පෙරණයන් (AC filters) සඳහා ශ්‍රී ලංකාවේ එකම නියෝජිතයා වේ. සිල්ලර විකුණුම් අත්පිට මුදලට සිදුකෙරෙන අතර, දේශීය නියෝජිතයන් හට ණය පහසුකම් සලසා දී තිබේ. දැනට, දේශීය නියෝජිතවරුන් 28 දෙනෙකු සහ සිල්ලර විකුණුම්හල් 2 ක් තිබේ. සමාගමේ වාර්ෂික පිරිවැටුම රු. මිලියන 100 ඉක්මවයි.

සමාගමේ සභාපති වන **සරත්**, සමාගමේ අභ්‍යන්තර විගණක ලෙස ඔබ ආයතනය පත්කර තිබේ. මාසිකව අභ්‍යන්තර විගණනය සිදුකර නිරීක්ෂණ මත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස විගණන හවුල්කරු ඔබගෙන් ඉල්ලා ඇත. ඔබ විසින් අභ්‍යන්තර විගණන කටයුතු දැන් ආරම්භ කර ඇති අතර, පහත සඳහන් කරුණු අවධානයට ලක්කර ඇත:

***මුදල් කළමනාකරණය:***

- මුදල් හා චෙක්පත් එකතුකිරීම් සහ ගෙවීම් සටහන් කිරීමට සහ සුළු මුදල් වියදම් සටහන් කිරීමට ගණකාධිකාරී එක්සෙල් පත්‍රිකා (excel sheets) පිළියෙල කරයි.
- සියලුම මුදල් / චෙක්පත් ලැබීම් සඳහා ලදුපතක් නිකුත් කෙරේ.
- හදිසි ගෙවීම් සිදුකිරීම සඳහා මුදල් අයකැමි ළඟ අත්සන් කළ හිස් චෙක්පත් තබා ඇත.
- ගෙවීම් සිදුකළ වහාම ඊට පසු, මුද්‍රණය කළ ගෙවීම් වවුචරය සහ ඊට අදාල ආධාරක ලියකියවිලි ගෙවීම් ගොනුවේ (file) ගොනුකරනු ලැබේ.
- මුදල් අයකැමි විසින් බැංකු සැසඳුම් පිළියෙල කරනු ලබන අතර, ඔහුගේ අධික වැඩ ප්‍රමාණය හේතුවෙන් පසුගිය මාස දෙක සඳහා බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි.

***තොග කළමනාකරණය:***

- ගබඩා කළමනාකරුට සමාගමේ වර්ෂ 15 කට වඩා පළපුරුද්ද තිබෙන අතර, සමාගමේ තොග අයිතම පිළිබඳ මනා දැනුමක් (sound knowledge) ඔහුට තිබේ.
- නැව් භාණ්ඩ ගෙනැවිත් බාරදෙන විට, සැපයුම්කරු විසින් සපයන ලද ලැයිස්තුවල සඳහන් අයිතම සමඟ භෞතිකව ලද ප්‍රමාණයන් සත්‍යාපනය කිරීමෙන් පසු භාණ්ඩ ලැබීම් පත්‍රය (GRN) නිකුත් කරනු ලැබේ.
- භෞතික තොග සත්‍යාපනය මඟින් තොග අයිතම පිළිබඳ කිසිදු වෙනස්කමක් අනාවරණය වූයේ නැත.
- සියලුම නිකුතු අනුමැතිය සහිතව කර තිබූ අතර, වාර්තා නිසිලෙස යාවත්කාලීන කර තිබුණි.
- ද්‍රව්‍ය අධියාචනා පත්‍ර [Material Requisition Notes (MRN)], තිබූ අතර, සියලුම නිකුත් කිරීම් අනුමැතිය සහිත ඉන්වොයිසි පිටපත් මඟින් සිදුකරන ලද අතර, ඉන්වොයිසියේ "නිකුත් කළා" (ISSUED) යන මුද්‍රාව තබා ඇත.
- ගබඩා කළමනාකරු විසින්, ගිණුම් අංශයේ නියෝජිතයන් ඉදිරියේ මාසික භෞතික තොග සත්‍යාපනය සිදුකරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මුදල් කළමනාකරණ සහ තොග කළමනාකරණ ක්‍රියාවලින් හැර සංවිධානයක ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාවලීන් දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(b) ඉහත විස්තර කර ඇති මුදල් කළමනාකරණ ක්‍රියාවලියේ දුර්වලතා හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(c) සමාගමේ තොග කළමනාකරණ ක්‍රියාවලියේ ශක්තීන් (strengths) හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(d) **සීමාසහිත සරත් එන්ජිනියරිං (පෞද්ගලික) සමාගමේ** වාර්තාවල නිරවද්‍යතාවය සත්‍යාපනය කිරීම සඳහා අභ්‍යන්තර විගණක විසින් ඉටුකරනු ලැබිය හැකි විශ්ලේෂණ පටිපාටි (analytical procedures) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(e) **සරත්** සමඟ පවත්වන ලද මූලික සාකච්ඡාවේදී ඔහු දැරූ මතය වූයේ ගබඩා දෙපාර්තමේන්තුවේ මනා (sound) අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බැවින් සමාගමේ තොග කළමනාකරණයේ කිසිදු වැරැද්දක් සිදුවිය නොහැකි බවය.

ඔබ **සරත්ගේ** ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(f) අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද පරිගණක පැකේජයක් සමාගම සතුව තිබුණ ද, ඉන්වොයිසිකරණය, වාර්තාකරණය, ගනුදෙනුකරුවන්ගේ ප්‍රකාශන සකස් කිරීම සහ තොග වාර්තා පවත්වා ගැනීමට පමණක් එය උපයෝගී කරගනු ලැබේ.

මුදල් පොත, බැංකු පොත සහ ලෙජර් ගිණුම් සහිත සම්පූර්ණ ගිණුම් පැකේජයක් ලෙස භාවිත කිරීමේ වැදගත්කම පිළිබඳව ඔබ ආයතනය මඟින් අවධාරණය කර තිබුණි. පද්ධතිය තුළ ඇති වැඩසටහන්වලට සිදුකළ හැකි අනවසර වෙනස්කම් වැළැක්වීමට හෝ අනාවරණය කර ගැනීමට සමාගම විසින් ස්ථාපිත කළහැකි පාලනයන් කවරේදැයි **සරත්,** විමසීමක් කර තිබේ.

පද්ධතියේ වැඩසටහන්වලට, සිදුකරනු ලබන අනවසර වෙනස්කම් වැළැක්වීමට හෝ අනාවරණය කර ගැනීමට ස්ථාපිත කළයුතු පාලනයන් හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත TR (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය භාර ජ්‍යෙෂ්ඨයා ඔබ වේ. **සීමාසහිත TR (පෞද්ගලික) සමාගමේ** දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ:

**පිරිවැය** *(රු.'000)*

| වත්කම් | 2018 අප්‍රේල් 01 දිනට ශේෂය | එකතු කිරීම් | ඉවත් කිරීම් | 2019 මාර්තු 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම | 58,000 | - | - | 58,000 |
| ගොඩනැගිලි | 25,000 | - | - | 25,000 |
| යන්ත්‍ර | 25,670 | 3,450 | - | 29,120 |
| මෝටර් වාහන | 10,450 | - | 2,400 | 8,050 |
| **එකතුව** | **119,120** | **3,450** | **2,400** | **120,170** |

**ක්ෂය** *(රු.'000)*

| වත්කම් | 2018 අප්‍රේල් 01 දිනට ශේෂය | වර්ෂය සඳහා අයකිරීම් | ඉවත් කිරීම් | 2019 මාර්තු 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 10,000 | 2,500 | - | 12,500 |
| යන්ත්‍ර | 15,402 | 3,080 | - | 18,482 |
| මෝටර් වාහන | 4,703 | 1,150 | 2,400 | 3,453 |
| **එකතුව** | **30,105** | **6,730** | **2,400** | **34,435** |

**සටහන:**

වර්ෂය අවසානයේදී ඉඩම සහ ගොඩනැගිලි වෘත්තීය තක්සේරුකරුවෙකු විසින් ප්‍රත්‍යාගණනය කරන ලදී. ප්‍රත්‍යාගණිත අගයන් පහත පරිදි විය:

ඉඩම : රු.75,000,000/-

ගොඩනැගිලි : රු.30,000,000/-

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් දේපළ, පිරියත සහ උපකරණ සඳහා විගණන පටිපාටි ඉටු කිරීමේදී ඔබට එක්රැස් කළ හැකි විගණන සාක්ෂි හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) ප්‍රත්‍යාගණනය කළ වත්කම් විගණනය කිරීමේදී ඔබ විසින් ඉටු කිරීමට අවශ්‍ය වන විගණන පටිපාටි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) ලිඛිත කළමනාකරණ නියෝජනය අවශ්‍ය කෙරෙන වැදගත් කරුණු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(d) ප්‍රත්‍යාගණනය කළ වත්කම් සම්බන්ධයෙන් වෘත්තීය තක්සේරුකරු සමඟ කටයුතු කිරීමේදී ඔබ විසින් සළකා බැලිය යුතු වැදගත් කරුණු හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(B) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත AB (පෞද්ගලික) සමාගමේ** ව්‍යවස්ථාපිත විගණන කාර්යභාරය වහාම බාරගන්නා ලෙස එම සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් වරලත් ගණකාධිකාරී ආයතනයක් වන **R සහ R ඇසෝසිටේස්** ආයතනයේ හවුල්කරුවෙකු වන **සුදත්ගෙන්** ඉල්ලා ඇත. **R සහ R ඇසෝසිටේස්** ආයතනය මීට පෙර කිසිදු දිනෙක **සීමාසහිත AB (පෞද්ගලික) සමාගම** සමඟ වැඩකර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සුදත්ට** මෙම විගණනය වහාම බාරගත හැකිදැයි **විමසන්න**. (ලකුණු 04)

(C) **සීමාසහිත UB (පෞද්ගලික) සමාගම,** 2000 වර්ෂයේ සිට **එරික් ඇසෝසියේට්ස්** ආයතනයේ විගණන සේවාදායකයෙකි. 2018/19 මූල්‍ය වර්ෂයේ සිට මෙම කාර්යභාරය සඳහා **තිමල්** විගණන හවුල්කරුවා බවට පත්විය. **සීමාසහිත UB (පෞද්ගලික) සමාගමේ** සභාපති විසින් **තිමල්** හට, අලුත් අවුරුදු තෑග්ගක් වශයෙන් මාලදිවයිනේ සුපිරි හෝටලයක දින 5 ක් නැවතී සිටීම සඳහා ප්‍රදානයක් සිදුකර තිබේ.

විගණන කාලය තුළ, **එරික් ඇසෝසියේට්ස්** හි විගණන කළමනාකරුට මූල්‍ය කළමනාකරු ලෙස බැඳෙන ලෙස සභාපතිවරයා ඉල්ලා තිබූ අතර, විගණන කළමනාකරු විසින් එලෙස සේවයට බැඳීම පිළිබඳ කොන්දේසි (terms) සභාපතිවරයා සමඟ සාකච්ඡා කරමින් (negotiating) සිටී. එහි අලුත් ගබඩා සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීමෙන් පසුවත් රු. මිලියන 30 ක ණය පිරිවැය, සමාගම විසින් ප්‍රාග්ධනිත කර ඇති බව විගණන කණ්ඩායම විසින් අනාවරණය කරගෙන තිබුණි. විගණනය සඳහා නිගමනය වූ ප්‍රමාණාත්මකභාවය (materiality) රු. මිලියන 15 කි. ණය පිරිවැය ප්‍රාග්ධනිත කිරීමට ඔහු එකඟ වන්නේ නැත්නම් විගණන ගාස්තු කපා හැරීමක් සිදුකරන බවට සභාපතිවරයා විසින් විගණන හවුල්කරුට දන්වා තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත දක්වා ඇති සිද්ධිය සම්බන්ධයෙන් ආචාරධර්මවල මූලික මූලධර්මයන්ට අනුකූලවීම කෙරෙහි ඇති තර්ජන තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |